# මිනිසා හා පරිසරය අතර ඇති සම්බන්ධතාවය භූමි පරිභෝගය තුළින් විශ්ලේෂණය කිරීම

එම්. එම්. එස්. ඒ. මාරසිංහ / ආර්. එම්. කේ. එස්. ආර්. රණවීර

## ප්‍රවේශය

පරිසරය පිළිබඳ ඇති බොහෝ අර්ථකථන තුළින් පරිසරය හඳුන්වා ඇත්තේ එය මිනිසා ඇතුළු ජීවීන්ගේ පැවැත්මට හේතු වන ජීවී අජීවී සම්පත් අතර අන්තර් සම්බන්ධතාවය ගොඩනගන පද්ධතියකි. අතීතයේ සිටම මෙම සම්බන්ධතාවය හඳුනාගෙන මිනිසා පරිසරය තම කටයුතු සඳහා යොදාගෙන ඇති ආකාරය විමසා බැලීම අතීතය තුළින් අනාගතය ගොඩනගා ගැනීමට රුකුලක් වන අතර වර්තමානයේ මුහුණපාමින් සිටින අර්බුධයන්ට මහත් අස්වැසිල්ලක් වනු ඇත. මේ අයුරින් සලකා බැලීමේදී පරිසරය සහ මිනිසා අතර සම්බන්ධතාවය ඉතා ඈත අතීතයට දිව යයි. එහිදී අතීතයේ මිනිසාගේ මැදිහත් වීම තිරසාර ප්‍රවේශයකින් යුතු වූ බව පැහැදිලිව හඳුනාගත හැකිවේ. මෙම තිරසාර අන්‍යෝන්‍ය සම්බන්ධතාවය සඳහා හේතු වූ කරුණු ලෙස එවකට පැවති ආර්ථික, සංස්කෘතික සමාජීය සහ දේශපාලනික සම්බන්ධතා ඒ හරහා දියුණු වූ ආකල්ප සංවර්ධනය හා තිරසාර පාලනය ලෙස හඳුනාගත හැකි අතර එකී හේතු වඩාත් විස්තර සහිතව විග්‍රහ කිරීම මෙමඟින් සිදු කෙරේ.

පැරණි සමාජ/ආර්ථික සංස්කෘතික හර පද්ධතීන් තුළින් පෝෂණය වූ පාලන ක්‍රමවේදයක් මඟින් තිරසාර භූමි පරිභෝගයක් සිදු වූ ආකාරය සොයා බැලීම. පරිසරය හා මිනිසා අතර සම්බන්ධතාවය අතීතයේ සිට පැවති ආකාරය හා එහි තිරසාර භාවයට බලපාන ලද සාධකයන් පිළිබඳව අධ්‍යයනය කිරීම මෙමඟින් බලාපොරොත්තුවේ. මෙම අධ්‍යයනය සඳහා තොරතුරු රැස් කරනු ලැබුයේ ද්විතියික මූලාශ්‍රයන්ගෙන් වන අතර එම දත්ත විස්තරාත්මක ක්‍රමවේදය අනුව විශ්ලේෂණය කර ඇත.

## විමර්ශනය

මෙම පර්යේෂණය තුළින් පරිසරය හා මිනිසා අතර අන්තර්සම්බන්ධතාවය පිළිබඳව විග්‍රහයක් විවිධ බාහිර සාධක මත පදනම්ව විවරණය කරනු ලැබේ. මෙහිදී පළමුව පරිසරය පිළිබඳව ඉදිරිපත් කර ඇති ප්‍රමුඛ පෙළේඅර්ථකථන 'කිහිපයක් මෙහිලා සාකච්ඡාවට ගැනීම වැදගත් වනු ඇත. වෙබ්ස්ටර් ශබ්දකෝෂයේ සඳහන් වන පරිදි පරිසරය යනු වස්තූන් හෝ අජෛව පාරිසරික සමාජයක් කෙරෙහි බලපාමින් අවසානයේ එහි ස්වභාවය හා පැවැත්ම තීරණය කෙරෙන දේශගුණික, භෞතික, ජෛවීය සාධකයන්ගේ සංකීර්ණයකි. තවද එය පුද්ගලයෙකුගේ හෝ සමාජ ජීවිතය කෙරෙහි බලපාන සමාජ හා සංස්කෘතික කරුණුවල එකතුවක් ලෙස සඳහන් කළ හැකිය.

මේ අනුව පරිසරය, සමාජය සංස්කෘතිය ආදී විවිධ අංශයන් හැඩගසන්නාවූත් මිනිස් අවශ්‍යතා සඳහා මාධ්‍ය සපයන පද්ධතියක් ලෙසත් හඳුනාගත හැකිය. එහිදී පරිසරය සමඟ ගණුදෙනු කරන ලද ආකාරය විවිධ පර්යේෂණ සහ ග්‍රන්ථ ආශ්‍රයෙන් පැහැදිලි වේ.

මිනිසා හා පරිසරය අතර සම්බන්ධතාවය අතීතයේ සිට විකාශනය වූ ආකාරය භූගෝල විද්‍යාත්මක පසුබිමකින් මෙසේ විවරණය කළ හැකිය. එනම් නියති වාදය, ශක්‍යවාදය හා තිරසාර සංවර්ධනයයි. මුල් යුගයේ එනම් දඩයම් යුගය එඬේර යුගය ආදී කාල පරාසයන්හි මිනිසා පරිසරයට යටත්ව ජීවත්

වි ඇත. එය නියති වාදය ලෙස හඳුනාගත හැකි වේ. එහිදී පරිසරයේ සම්පත් වෙනසක් නොකොට ඒ ආකාරයෙන්ම භාවිතා කළ අතර මිනිසා පරිසරයට අවනතව ජීවත් වී ඇත. භෞතික පරිසරය දේශගුණය හු විෂමතාවය ආදී සියලු පරිසර අංග වලට යටත්ව මිනිසා තම කටයුතු සිදු කරන ලදී. නමුත් කාලයාගේ ඇවෑමෙන් තාක්ෂණයේ දියුණුවත් සමඟ මිනිසා පරිසරය අභිබවා යෑමට උත්සහ කරන ලදී. එසේම තාක්ෂණය යොදාගෙන පරිසර අංග වෙනස් කරමින් මිනිසාට අවශ්‍ය ආකාරයට සම්පත් පරිහරණය කිරීමට පෙළඹිණි. හරිත විප්ලවය නාගරීකරණය ආදිය බිහි වූයේ මේ කාල සීමාව තුළදීය. මිනිසා පරිසරයේ සම්පත් සීමාව ඉක්මවා පරිහරණය කිරීමට පෙළඹිණි. මේ හේතුවෙන් පරිසර සම්පත් ක්ෂය වීමටත් පරිසර දූෂණය වීමටත් ලක් වූ අතර මේ නිසාවෙන් විවිධ අර්බුධයන්ට මුහුණ පෑමට සිදුවිය. මේ හේතුවෙන් නැවත පරිසරය ප්‍රමුඛ කොට සලකමින් තීරණ ගැනීමේ යුගයක් බිහිවිය. එය තිරසාර සංවර්ධනය පිළිබඳව අවධානය යොමු වූ යුගයයි. පරිසර අර්බුධයන්ගෙන් පීඩා විඳින මානව සමාජය නව තාක්ෂණයන් හා සංකල්ප තුළින් තිරසාර සංවර්ධනය ලඟා කර ගැනීමට මේ වන විටත් උත්සහ කරමින් සිටියි. මෙම නව සංකල්ප තුළින්ද චක්‍රාකාරව පැරණි තාක්ෂණික ශිල්ප ක්‍රම, ආකල්ප හා හැඩ ගැසීම් නැවත කරලියට එන බව විශේෂයෙන් හඳුනාගත හැකි වේ. ඒ ආකාරයෙන් පරිසර අර්බුධ සීමා කොට නැවත මිනිසා සහ පරිසරය සහජීවනයෙන් යුතුව මනා කළමනාකාරීත්වයෙන් හැසිරෙන යුගයක් බිහිකිරීම සඳහා අතීතයේ මිනිසා හා පරිසරය අතර සම්බන්ධතාවය පිළිබඳව ගැඹුරින් සොයා බැලීම අවශ්‍යය වේ.

**පරිසර සංරක්ෂණය හා බුදු දහම**

පරිසර සංරක්ෂණය යන සංකල්පය මුල් වරට මානව සමාජයට හඳුන්වාදුන් දේශකයාණෝ බුදුරජාණෝය. බුද්ධ චරිතයේ විශේෂ අවස්ථා රැසක් පරිසරය හා බද්ධ වී තිබිණි. එසේම පරිසරයට මානවයා මිතුරු විය යුත්තේය යන්න බුද්ධ දේශනයයි. පහත සඳහනින් පැහැදිලි වේ.

''ආරාමරෝපා වනරෝපා    යෙ ජනා සෙතුකාරකා
පපඤ්ච උදපානඤ්ච    යෙ දදන්ති උපස්සයං''

පැවිදි ජීවිතය රුක් මුල් ඇසුරු කොට ගෙවිය යුතු බව එමඟින් දක්වා තිබේ. මෙය භික්ෂුව සඳහා විනය නීතියෙන් පනවා පරිසර සංරක්ෂණය පිළිබඳව අවධානය යොමු කළ බුදුන් වහන්සේ එක් අවස්ථාවක දේශනා කොට ඇත්තේ නිල් තණකොළ මතින් පිණ්ඩපාතයෙහි නොයන්න යනුවෙනි. මේ අනුව බුදුන් වහන්සේ ඇතුළු ශ්‍රාවක පිරිස පරිසර සංරක්ෂණය සඳහා කැපවෙමින් වැඩ වසන ලද අතර ඒ ඇසුරේ වැඩෙන ජන සමාජය ද ඒ තුළින් සිය ආකල්ප දියුණු කරගත් බව හඳුනාගත හැකිය. තවද ලංකා ඉතිහාසය තුළ මහින්දාගමනයත් සමඟ ඇති වූ බෞද්ධ දහමින් පෝෂණය වූ සමාජයේ පාරිසරික සංරක්ෂණ ආකල්ප හඳුනාගත හැකිය. දඩයම් කිරීම විනෝදාංශයන් කොට ගත් එකළ රජු ප්‍රමුඛ ජනතාව ඒ සියල්ලෙන් මිදී බෞද්ධ ආකල්ප වලින් සිය ජීවන රටාවන් වෙනස් කර ගත්හ. ඒ නිසාම පරිසරයද පූජනීයත්වයෙන් සැලකීමට පෙළඹිණි. තවද සංඝමිත්තා මෙහෙණියගේ ආගමනයෙන් පසු ජයශ්‍රීමහා බෝධිය පූජනීයත්වයෙන් සලකන්නට විය. එහිදී පවා විද්‍යමාන වන්නේ බෞද්ධ දහම තුළින් පරිසර හිතකාමී ආකල්ප සංවර්ධනයට පුරෝගාමී වන ආකාරයයි.

මීට අමතරව තමා ජීවත් වන පරිසරය මානසික හා ශාරීරික වර්ධනයට හේතුවන බව බුදුරජාණන් වහන්සේ මනා ලෙස දේශනා කොට ඇත. භාරතයේ තමන් වහන්සේ ජීවත් වූ භෞතික පරිසරයේ සුන්දරත්වයෙන් හා නිසල බවින් ලැබූ අත්දැකීම් තුළින්, බෞද්ධ දර්ශනය පෝෂණය කළ බුදුන් වහන්සේ පරිසර පද්ධතීන් තුළින් ගත් ආදර්ශයන්ගෙන් මිනිසාගේ පැවතුම්, යහමගට යොමු කිරීමටද, මිනිසාගේ පැවැත්ම ජීවත්වන පරිසරයට අනුකූලව හැඩගස්වා ගැනීමට අවශ්‍ය වන බව දේශනා කළහ. එහදී දේශපාලන, ආර්ථික, සංස්කෘතිකපිළිවෙත් භාවිතය පරිසර සම්පත් ආරක්ෂා කිරීමට හේතු වන බව තවදුරටත් දේශනා කර ඇත.

බුදු දහමත් සමඟ ශ්‍රී ලාංකික සමාජය පරිසරය සඳහා ලබා දුන් වටිනාකම හා වැදගත්කම සුවිශේෂි වේ. ආගමික සමාජීය වටිනාකම් තුළින් සුවිශේෂී පාරිසරික ජීවන රටාවක් බිහිවූ බව පෙනෙන්නට තිබේ. එයට හේතුව වන්නේ ආකල්පමය වෙනසකි. ආකල්ප යන වචනයට ඇති අර්ථකථන ගණනාවකි. ශ්‍රී සුමංගල ශබ්දකෝෂයෙහි ආකල්ප යන වචනය යහපත් වූ ඉරියව් පැවැත්වීම යනුවෙන් දක්වා

ඇති ඕල්පෝර්ට් (1935) ආකල්ප පෞර්ෂය පිළිබඳව බලපෑම් කළ හැකි සමාජ හැසිරීම් කෙරෙහි මඟ පෙන්වීමක් කළ හැකි වැදගත් සංකල්පයක් ලෙස දක්වයි.1 මේ අදහස් අනුව මිනිසාගේ හැසිරීම් රටාවේ වෙනසක් ඇති කිරීමට ආකල්ප බලපාන බව පැහැදිලිවම කියැවේ. ආකල්ප තුළින් සමාජ සංස්කෘතික බලපෑම් කර ඇති බවද සඳහන් කරයි.එහෙයින් ස්වාභාවික වස්තූන් රැක ගැනීමට, ආකල්ප පැහැදිලි ලෙසම බලපෑම් කරන බව කිව හැක. ඒ අනුව ආගම හා ආකල්ප අතර සම්බන්ධතාවයට සාමාජීය හා සංස්කෘතික වශයෙන් වැදගත් වෙනසක් කළ හැක. මිනිසා හා විශ්වය අතර ඇති සම්බ්න්ධතාවය සෑම ආගමකටම පදනම වන බැවින් ආගමික විශ්වාස තුළින් ඇති වන හැසිරීම් හා පිළිවෙත් මඟින් මිනිස් චර්යා ධර්ම ගොඩනැංවීමෙහිලා පෘථුල බලපෑමක් කළහැකි බව කිව හැකිය.

භාරතීය ආභාසය හා පරිසර සංරක්ෂණය ඓතිහාසික යුග වලදී ජන සමාජය තුළ තිබූ ආකල්පයන් හා ආගම අතර ඉතා සමීප සම්බන්ධතාවයක් තිබුණු බවට සාධක ඇත. බෞද්ධ ධර්මය හා සමාජය අතර තිබූ බැඳීම ඒ අතර වැදගත් ස්ථානයක් හිමි කර ගනී, විශ්වාසයක් හෝ ඇදහීමක් තුළින් ගොඩනැගුණු දෙයක් පිළිගැනීමට වඩා විමසීමෙන් හා නිරීක්ෂණය කිරීමෙන් ඒ හා එකඟ වන ලෙස බුදු දහමේ උගන්වා ඇත. ඒ අනුව බුදු දහම තුළින් ආකල්ප පැහැදිලිව දැක තර්ක කිරීමෙන් පසුව හඳුනා ගැනීමට ද එහි සත්‍යතාවය අනුව හැඩ ගැසීමකටද  යොමු කරයි.භාරතීය දර්ශනයන්හි දැකිය හැකි ස්වාභාවික සම්පත් පිළිබඳ ආකල්ප විවිධ සාහිත්‍ය මූලාශ්‍ර වලින් පෙන්වා දිය හැකිය. එනම් වෛදික සාහිත්‍යයට අනුව මොහොන්දොජාරෝ හරප්පා ශිෂ්ඨාචාරයන් ආශ්‍රිතව ජීවත් වූ ජනතාවගේ ආගමික විශ්වාස ඇදහිලි බිහි විමේ පදනම ස්වාභාවික සම්පත් මුල්කර ගෙන බවට සාධක ඇත. වෘක්ෂ වන්දනාව, සතුන්ට පුද පූජා කිරීම, ඉන්දු නිම්න ශිෂ්ඨාචාරය තුළින්ද හඳුනාගත හැකිය.[2] මේ අනුව ආගම තුළින් වෙනස් වන ආකල්ප හරහා පරිසර සංරක්ෂණයට මඟ පෑදුණු බව උපකල්පනය කළ හැකිය.

බුදු දහම හා පරිසරය අතර සම්බන්ධතාවය මෙලෙස දිග හැරෙන විට රාජ්‍ය පාලනය හා පරිසරය අතර සම්බන්ධතාවයද ඉතිහාසය තුළින් ප්‍රකටවපෙනෙන්ට තිබේ. රාජ්‍යයත්වයේ ලක්ෂණත්, පාරිසරික ලක්ෂණත් සැසඳීමෙන් රාජ්‍යයත්වය මෙන්ම පාරිසරික සම්පත් එක හා සමානව රැකිය යුතුය, ගෞරව කළ යුතුය යන අදහස් තහවුරු කරයි. එමෙන්ම මූලික භෞතික ලක්ෂණ රැකිය යුතු බව ඉතා පැහැදිලි ලෙස හඳුනාගෙන සිටිය බවද පෙන්නුම් කරයි. පෘථිවියේ නිපදවන සම්පත් නිසිලෙස භාවිතයට හා අනිසි ලෙස භාවිතයට රාජ්‍ය පාලනය මැදිහත් වූ අවස්ථාවන් ශ්‍රී ලාංකීය සමාජය තුළින්ද මොනවට පැහැදිලි කළ හැකිය. යම් කෙනෙක් පරිසරයට යම් අනිසි දෙයක් සිදුකොට ඉන් මිදීමට යමෙක් කල්පනා කරන්නේනම් ඔහු විසින් අහුලාගත් වී කරල් වලින් දොලොස් දිනක් යැපිය යුතු බව දක්වා පනවා ඇති දඬුවම් වලින්ද පැහැදිලි වන්නේ ජනතාව එවැනි වැරදි ක්‍රියාවන් වලින් වැළැක්වීමට හා පරිසර ආරක්ෂාවට රාජ්‍ය පාලනය මැදිහත් වි ක්‍රියාකළ ආකාරයයි.[3]

තවද ජලයේ පූජනීයත්වය, වෘක්ෂලතා සම්පත, වනජීවීන් සම්පත් ලෙසත් මෙකී සම්පත් විනාශ කිරීම පාපයක් ලෙසත් මනුස්මෘතියේ දක්වා ඇත. ඵලදරන වෘක්ෂ, පඳුරු, පැළ, මල් පිපෙන පැළෑටි ආදිය කැපීම පාපයක්ය. සතුන් මැරීම පාපයක් කොට දක්වා ඇත. එමෙන්ම ආහාරවල කුඨ බඩු වල හෝ ඵල මල් ආදියෙහි ජීවත්වන කවර හෝ ප්‍රාණියෙකු මැරීම පාපයක් බවද දැන හෝ නොදැන සත්වයින්ට හිංසා කිරීම පාපයක් බවද මනුස්මෘතියේ දක්වා ඇත. කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍රයෙහි අන්තර්ගත කරුණු විමර්ෂණය කරන විට පෙනෙන්නේ එම කෘතියෙන්ද පුළුල්ව හා අර්ථාන්විතව පරිසරය හා පරිසරය සංරක්ෂණය කරගැනීමේලා රාජ්‍ය පාලකයින් වෙත ඉදිරිපත් කළ දේශපාලන හා ආර්ථික ධර්මතා සමූහයකි. පාලක පාලිත දෙපක්ෂයෙහිම ආර්ථික, සමාජීය සහ දේශපාලනික යන අංශයන්හි ප්‍රතිපත්තීන් තුළින් පරිසර සම්පත් අනාගතයටද සුරැකීම පිළිබඳව අවශ්‍ය වන පුද්ගල වගකීම ගොඩනැගීමට අතිවිශාල බලපෑමක් එම කෘතිය මඟින් කරන ලද බව පෙනේ. මිනිසා පරිසරයේ අංගයක් ලෙස සලකා භෞතික පරිසරය රැක ගැනීමට ඇති අවශ්‍යතාවය ක්‍රියාකාරී වැඩ පිළිවෙලක් තුළින් ජනතාවට යොමු කිරීම සඳහා සුදුසු පසුබිමක් එම කෘතියෙන් සකස් කර ඇත.

---

1 ඒ. ෆොන්සේකා, **අතීත රජදරුවන්ගේ පරිසර ප්‍රතිපත්ති**. (කොළඹ: ග්ලෝබ් ප්‍රින්ටින් වර්ක්ස්.1998)

2 ඒ. ෆොන්සේකා, **අතීත රජදරුවන්ගේ පරිසර ප්‍රතිපත්ති**. (කොළඹ: ග්ලෝබ් ප්‍රින්ටින් වර්ක්ස්.1998)

3 ඒ. ෆොන්සේකා, **අතීත රජදරුවන්ගේ පරිසර ප්‍රතිපත්ති**. (කොළඹ: ග්ලෝබ් ප්‍රින්ටින් වර්ක්ස්.1998)

**රාජ්‍ය පාලනය හා භූමි පරිහරණය**

රාජ්‍ය මැදිහත්වීම පරිසර සම්පත් කළමනාකරණය සඳහා ඉවහල් වූ ආකාරය සාකච්ඡාවට ගැනීමද වැදගත් වේ. මේ කාරණය භූමි පරිහරණය, සම්පත් බෙදා ගැනීම ආදිය සඳහා මැදිහත් වූ ආකාරය හඳුනාගැනීම සඳහා ඉවහල් වනු ඇත. රජු හෙවත් ජනතාවගේ පාලකයා හඳුන්වා ඇත්තේ පොළොව නැතහොත් පෘථිවියේ අධිපතියා වශයෙනි. ස්වාභාවික සම්පත් සීමිත හෙයින් මිහිතලය මත ඇති සෑම සම්පතක්ම සුරැකීමේ අයිතිය හා භාරකාරත්වය රජුට හිමිවන නිසා සම්පත් හිතුමතයට පරිහරණය කළ නොහැකි යන ආකල්පය ඇති කර ඇත. ස්වාභාවික සම්පත් රජුගේ පාලනයට යටත් වුණි. වනාන්තරය වන සම්පත් පමණක් නොව පොළොව මතුපිට ඇති තොටුපොළ වැව් ජලාශ හා මත්ස්‍ය සම්පත්ද එකී දෑ උපයෝගී කොටගෙන ගොඩ නැංවී තිබූ සියලුම ආර්ථික කටයුතු රජුගේ ස්වාමීත්වය යටතේ සිදුවිය යුතු විය.

රජු භූමියේ අධිපතියා නිසා භූමිය හා බැඳුණු සම්පත් වූ වනාන්තරය හා වන ජීවීන්ද ජලයද අනෙකුත් සම්පත්ද රජුගේ අවසරයක් නොමැතිව පරිහරණය කළ නොහැකි විය. මෙම සම්පත් සඳහා රාජ්‍ය ආරක්ෂාව ලැබිණි. එදිනෙදා අවශ්‍යතාවයන් සඳහා සම්පත් පරිභෝජනයට අවස්ථාව සලසා තිබූ නමුත් සුවිශේෂී කටයුතු සඳහා විශේෂ අවසරයක් සුවිශේෂි නිළධාරීන්ගෙන් ලබා ගැනීමට අවශ්‍ය විය. මේ ආකාරයෙන් නීති පැනවීමෙන් පැහැදිලි වන්නේ වන සත්ත්ව සම්පත් පුද්ගලයන්ගේ අභිමතය පරිදි පරිහරණය කිරීමත් විනාශ වීම වැළැක්වීමත් හා පරිසර පවිත්‍රතාවය, පරිසර සම්පත් සංරක්ෂණය ආදිය තහවුරු කිරීමත්ය. එහිදී පුද්ගල වගකීම අතීතයේ සිටම මනාව හඳුනාගෙන ඇති අතර පරිසරය රැ කීමේදී පුද්ගල වගකීම ඉතා වැදගත් වන බවත් යහපත් (සමාජ) පරිසරයක් ඇතිවීමට නම් පුද්ගලයින් විසින් තමා අවට පරිසරය පිළිබඳව පුද්ගල වගකීමක් ඇතිව කටයුතු කළ යුතු බව අර්ථ ශාස්ත්‍රයේ දක්වා ඇත. නාගරික පරිසරයේ සෞන්දර්යාත්මක බව, පවිත්‍රතාව හා එම සමාජයේ ජීවත්වන ජනතාවගේ පාරිසරික සෞඛ්‍යය, සමාජ සුභ සාධනය, පාරිසරික දෘෂ්ටි කෝනයකින් අවධානයට ලක් කොට ඇත. නාගරික පරිසරයේ පවිත්‍රතාවය ගැන සඳහන් කරන කෞටිල්‍ය නගරය ඇතුලත වීදි වල කසල දැමීම සතුන්ගේ මළකුණු හෝ මිනිසුන්ගේ මෘත ශරීර දැමීම පූජනීය ස්ථාන වල මූත්‍රා මළ අසූචි ආදී අපද්‍රව්‍ය දැමීම දඬුවම් ලැබිය යුතු වරදක් වශයෙන් දක්වා ඇත.

නගරයක් තුළ ඇතිවිය හැකි කැලි කසල එකතුවීම, අපවිත්‍ර ජලය, සෞඛ්‍ය පිරිහීම, ශබ්ද දූෂණය වැනි පාරිසරික ප්‍රශන වළක්වා ගැනීමට එකිනෙකා තමා සතු වගකීම ඉටු කළ යුතු බව පෙන්වා දී ඇත. නිවාස දෙකක් ඉදි කිරීමේදී ධාන්‍ය ඇඹරුම් හල ගිනි උඳුන් වැනි දෑ ඉදි කිරීමේදීද එම ගොඩනැගිලි දෙකක් අතර තිබිය යුතු නියමිත දුර ප්‍රමාණයත් ඉදිරිපත් කරන කෞටිල්‍ය එක් නිවසක දොරක් හෝ ජනේලයක් පවා අනෙකෙකුගේ නිවසකට මුහුණලා තැනීම නුසුදුසු සේ දක්වා ඇත. අපවිත්‍ර ජලය බැසයන කාණු පාරිසරික අශෝභන තත්ත්වයෙන් යුතුව නිර්මාණය නොකළ යුතු බවද අර්ථ ශාස්ත්‍රයේ සඳහන් වෙයි.

සම්පත් දිගු කාලීන පරිහරණය සඳහා ආරක්ෂා කරගත යුතුය යන අදහස පිළිගත් බුදු දහම ඒ සඳහා වඩාත් හිතකාමී ලෙස සරල දිවි පැවැත්ම නිර්දේශ කරන ලදී. සරල ජීවන ක්‍රමයක් ගොඩනගා ගත යුත්තේ කෙසේදැයි බුදු දහම තුළින් පෙන්වා දී ඇත. තනි පැවැත්ම වෙනුවට පොදු පැවැත්මත්, සමූහ පරිහරණයත්, සංරක්ෂණය ගැබ් වූ සම්පත් පරිභෝජනයත් බුද්ධ ධර්මය නිරතුරුවම පෙන්වා දී ඇත. පිරිමැස්මෙන් කටයුතු කිරීමද බුදු දහමේ නිරතුරුවම පෙන්වා දී ඇති චර්යා ධර්මතාවයකි. පිරිමැස්මෙන් කටයුතු කිරීම තුළින් සිදුවන්නේ සම්පත් විනාශවීමට ඇති ඉඩ ඇහිරීයාමකි. සම්පත් පරිහරණයේදී අවශ්‍ය පමණට සම්පත් ලබාගන්නවා මිස නිකරුනේ නාස්ති කිරීමෙන් අනාගත පරපුර සඳහා ඇති සම්පත් අපතේ හැරීම නොකළ යුතු බව බුදුරජාණන් වහන්සේ සිය දේශනා වලින් පෙන්වා දී ඇත.

අවිචාරවත්ව ද්‍රව්‍ය අපතේ හරින්නා උදාහරණ වශයෙන් අත්ත සොලවා ඉදුණු එල පමණක් නොව නොපැසුණු එලද බිම දමා බොහෝ එල අපතේ හරින පුද්ගලයෙකු ලෙස හඳුන්වාදී ඇත.[4]

මෙකී සිද්ධාන්තය භූමි පරිභෝජනය සඳහාද ආදේශ කරමින් බෞද්ධ දර්ශනය ඒ සඳහා දරන


4 ඒ. ෆොන්සේකා, **අතීත රජදරුවන්ගේ පරිසර ප්‍රතිපත්ති.** (කොළඹ: ග්ලෝබ් ප්‍රින්ටින් වර්ක්ස්.1998)

ලද ආකල්ප විශ්ලේෂණය කළ හැකිය. අතීතයේ ශ්‍රී ලංකාවේ සංස්කෘතිය, ආගම යනාදී අංශයන් ග්‍රාමීය සමාජයේ ගොඩනැගීම උදෙසා බොහෝ සේ ඉවහල් වී ඇති අතර ග්‍රාමීය භූමි පරිහරණය පවා ආගම සංස්කෘතිය මුල්කොට ගෙන බිහි වූවක් ලෙස සැලකිය හැකිය.

අතීතයේ සිට පැවත එන වැවයි, දාගැබයි, ගමයි, පන්සලයි යන සංකල්පය තුළ මෙකී සියලු කාරණා උදාහරණ තුළින් පෙන්නුම් කෙරේ. වැවයි ගමයි තුළින් ආර්ථිකය සවිබල ගැන්වෙන අතර දාගැබ පන්සල ගම තුළ සදාචාරය, සංස්කෘතිය හා ආකල්ප සංවර්ධනය පෙන්නුම් කරයි. මෙකී අංශයන් සියල්ලගේම දායකත්වය තුළින් ආධ්‍යාත්මය දියුණු වූ සංවර්ධිත තිරසාර සමාජයකට උරුමකම් කීමට අතීත ශ්‍රී ලංකාවට හැකියාව ලැබිණි. ගම තුළ වෙන් කර ඇති භූමි ප්‍රමාණය සියලු ප්‍රධාන අංගයන් පිහිටුවා ගැනීම සඳහා භූමියක් වෙන් කෙරුණු අතර භූ විෂමතාවය, භූමි පරිභෝග රටා, මංමාවත්, ජල මූලාශ්‍ර ආදී කරුණු සැලකිල්ලට ගෙන තිරසාර නගර/ග්‍රාම සැලසුම් නිර්මාණය වී තිබේ. මෙහිදී සම්පත් උපරිම ලෙස භාවිතා කරමින් සහ නිසිලෙස කළමනාකරණය කර ගනිමින් ගම සැලසුම් කර ඇති අවස්ථා සඳහා උදාහරණ ලංකාවේ විවිධ ප්‍රදේශ වලින් හඳුනාගත හැකි වේ. මේ සඳහා ආගමික බලපෑම සහ රාජ්‍යයත්වය සෘජු ලෙසම බලපාන ලද බවද හොඳින් විද්‍යාමාන වේ.


භූමිය මිනිසාගේ පැවැත්මට අවශ්‍ය තවත් දෑ ගත් සම්පත් සංකලනයකි. ශ්‍රී ලංකාව මුළුමනින්ම වාගේ කෘෂිකාර්මික පදනමක් මත සිය ආර්ථික ප්‍රතිපත්තිය ගොඩ නගා ගත් රටකි. මේ නිසා භූමිය හා බැඳුණු විවිධ ස්වාභාවික සම්පත්ද පොදුවේ භූමිය යන ඒකකය කළමනාකරණය පිළිබඳවද විවිධ නීතිරීති හා ප්‍රතිපත්ති විවිධ අවස්ථා වලදී සකස් කිරීමත් කර තිබූ බව පෙනේ.

භූමියේ ස්වභාවයන් මත පදනම්ව භූමි පරිභෝගයන් සඳහා තිරසාර ලෙස පරිසරය භාවිතා කළ බවට මනා උදාහරණ ලෙස ගංගා නිම්න ආශ්‍රිතව බිහිවූ ශිෂ්ඨාචාරයන්ගෙන් පෙන්වා දිය හැකිය. ලෝකය තුළ මෙන්ම ලංකාව තුළත් මෙම ලක්ෂණ කැපී පෙනෙන ලෙස හඳුනාගත හැකිය.




https://www.scoop.it/t/year-7-history-river-civilisations-in-ancient-india , Viewed, 04.07.2018

ලෝකයේ සුවිශේෂී ගංගාශ්‍රිත ශිෂ්ඨාචාරයන් ලෙස ඉහත සිතියමේ දක්වා ඇති පරිදි ඉන්දියාවේ ඉන්දු නිම්න හා ගංගානම් ගඟ ආශ්‍රිතවත් චීනයේ කහ ගඟ ආශ්‍රිතවත් ඊජිප්තුවේ නයිල් ගඟ ආශ්‍රිතවත් ඉතා ස්වංපෝෂිත ශිෂ්ඨාචාරයන් බිහි වී ඇත. ලංකාවේද පුරාණ ගම්මාන හා නගර බිහිවී ඇත්තේ ගංගා නිම්න ආශ්‍රිතවයි. ඒ ආශ්‍රිතව නගර නාම නිර්මාණය වී නව සංස්කෘතීන් බිහි වී ඇත. ඒ අනුව විද්‍යාමාන වන්නේ පරිසර සාධක මත පදනම්ව භූමි පරිහරණ රටාවන් හා නව සංස්කෘතීන් බිහි වූ ආකාරයයි.




https://www.researchgate.net-rivers in Sri Lanka- Viewed 04/07/2018

ඉඩම් පරිභෝජනය සඳහා උචිත පස, බෑවුම් තැනිතලා ආදී භූමියේ ස්වාභාවික පිහිටීමේ තත්ත්වයන්ද සහ ජීවීන්ගේ පැවැත්ම පිළිබඳවද අවධානයට ලක් කර භූමිය වර්ගීකරණය කර ඇත. එනම් වගාව සඳහා මනා කෘෂිකාර්මික පසක් සහිත තැනිතලා භූමිය සුදුසු වන අතර බෑවුම් සහිත භූමිය වගාවට නුසුදුසු ස්ථාවර තෘණ බිම් ප්‍රදේශ වල සුදුසු වනු ඇත. ජලාධාර සංරක්ෂණය සඳහා සුදුසු අධික බෑවුම් සහිත ප්‍රදේශයන්ය. මෙකී තත්ත්වයන් රාජ්‍ය ප්‍රතිපත්තීන් සඳහා යොදාගෙන තිබීම ස්වංපෝෂිත සමාජයකට විශේෂ සාධකයක් වී ඇත. පුරාණ ගම්මාන වල සැලසුම් අධ්‍යයනය කිරීමේදී තැනිතලා පහත් බිම් වගා ප්‍රදේශ සඳහාත් උස් ශේෂ බිම් පූජනීය ස්ථාන සඳහාත් යොදාගෙන ඇති ආකාරය දැක ගත හැකි වේ.

එහිදී භූමියේ පිහිටීම නැතහොත් භූ විෂමතා ලක්ෂණ ඉඩම් පරිභෝග කිරීමේදී ඉතාමත් වැදගත් සාධකය ලෙස සැලකිණි. පරිභෝජනයට පෙර ස්වාභාවික පිහිටීමේ තත්ත්වයන් හඳුනා ගැනීම සහ උචිත ක්‍රම උපයෝගී කර ගැනීම මත එහි සාර්ථක භාවය රඳා පවතින බව කිව හැකිය. මහාචාර්ය පරණවිතාන සංස්කරණය කරන ලද ලංකා ඉතිහාස ග්‍රන්ථයෙහි දක්වා ඇති පරිදි මානුෂික වර්ධනයටත්, ආර්ථික වර්ධනයටත් අවශ්‍ය තත්ත්වයන් අතින් එකිනෙකට වෙනස් වන පරිසර වලින් යුත් ප්‍රදේශ ගණනාවකට බෙදී පවතින්නේ භූ ලක්ෂණ මතය. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ පැරණි ජනපද හා සභ්‍යත්වය ඇති වීමට මුල් වූයේ වැව්, අමුණු වේලි ආදිය මඟින් ජලය සම්පාදනය දියුණු කිරීමය. වැව් වල ප්‍රධාන අංග වන වේලි, අමුණු, සොරොව්, පිට වාන් ආදිය තැනීමේදී මෙරට වැසියෝ පාෂාණ උද්ගතයන් පිහිටි ආකාරයෙන්ම හැකිතාක් ප්‍රයෝජනයට ගත්හ. පරිනග්නීකරණයේ ශේෂයන් වන සීගිරිය, යාපහුව ආදී පැරණි ගිරි බලකොටු භූ තත්ත්වය මිනිසාට ප්‍රයෝජනවත් වී ඇති ආකාරයට මනා උදාහරණ වෙයි.

භූමිය පිළිබඳව සාකච්ඡා කරන විට තවත් එහි ඉතා වැදගත් ඒකකයක් වූ පස ගැන කරුණු අවධානයට ගතයුතු වේ. භෞමික පරිසර පද්ධතියක පැවැත්ම රඳා පවතින්නේ පස මතය. ලෝකයේ සමෘද්ධිමත් ශිෂ්ඨාචාර ගොඩ නැගීමට හේතු පාදක වී ඇත්තේ ගංගා නිම්න ආශ්‍රිත සාරවත් පස සහ භූමිය නිසිලෙස පරිහරණය කිරීමයි. ශ්‍රී ලංකාවේ රජුන්ගෙන් ගොඩනැගුණු රජරට වියළි කලාපයේ බැදුණු භූ රූප පස, ජල සැපයුම යන කරුණු ආර්ථික කටයුතු ගොඩ නැංවීමෙහිලා විශාල බලපෑමක් කරන ලද අතර රජුගේ අනුමැතිය හා උපදේශකත්වය මත භූමි පරිහරණ කටයුතු සඳහා සම්පත් භාවිතය සිදු කෙරිණි.

ප්‍රාග් බෞද්ධ යුගයේ සිට ගොඩනැගී ශත වර්ෂ ගණනක් වර්ධනය වුණු මනා භූමි පරිභෝග සැලැස්ම පළමු පරාක්‍රමබාහු රාජ්‍ය පාලන කාලය වන විට කෙතරම් පැහැදිලි අදහසක්ව තිබුණේද යන්න චූලවංශය සාක්ෂි දරයි. නීති දත් ඒ රජ තෙමේ මාගේ රාජ්‍යයෙහි යම් කිසි තැනෙක්හි පැමිණි උපකාර රහිත වූ කුඩා ගෙපල් (පමණ බිම්) කුත් නොතිබේවා. මල් පිණිස ප්‍රසිද්ධ වූ ද ඵල පිණිස ප්‍රසිද්ධ වූද එසේම නොයෙක් වැල් රුක් වෙහෙසින් ගණව වැඩුනා වූ බොහෝ වූ නොයෙක් අනුභවයට උදාර වූ නානා විධ උපතින් සොඳුරු වූ සිත් අලවන්නා වූ ආරාමයක් ඒ ඒ තන්හි පිහිට වූයේය. එමෙන්ම පස් යොදුන් වගමඩ හා කුඩා විල් කප්පවා එයින් ජලය ගංගාවල හෙලා කෙත් පැවැත්වූ බවත් චූල වංශයේ සඳහන් කර ඇත.භූමි පරිභෝග සැලසුම් පැරණි රාජ්‍ය ප්‍රතිපත්ති තුළ ක්ෂණිකව ඇති වූවක් නොව ප්‍රාග් බෞද්ධ යුගයේ සිට ඇති වූ වර්ධනයක ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැකිය. එයට භූමියේ ස්වාභාවික පිහිටීමේ තත්ත්වය, පස, ජලය, වන සම්පත, වනජීවීන් ආදිය පිළිබඳ අවධානය අන්තර්ගත වී තිබිණි [5]

මහාවංශයේ දැක්වෙන පරිදි පණ්ඩුකාභය රජු රාජ්‍ය පාලනය ක්‍රමවත් කරමින් ප්‍රධාන නගරය ලෙස අනුරාධග්‍රාමය තෝරාගෙන එය මනාව සැලසුම් කරගෙන ඇත. පණ්ඩුකාභය රජු අනුරාධපුර නගරය වෙන් කිරීමේදී මළ මිනී බැහැර කරන සොහොන් ආදී සැඩොල් ගම්ද එම ගමකට ඊසාන දිග්හි සැඩොලුන්ගේ සුසාන භූමියද, උතුරින් වැද්දන්ගේ ගෙවල්ද උතුරු දිග්හි ගැමුණු වැව දක්වා තවුසන්ගේ අසපුද නිසණ්ට, ශ්‍රමණ ආදී පූජ්‍ය පිරිස් සඳහා නිවාසද වශයෙන් වෙන් කර දක්වයි. කුලයන් 500ක් සඳහා භූමිය වෙන් කරන ලද අතර මෙයින් සනාථ වන්නේ ගොඩනැගිලි ඉදිකිරීමේදී භූමිය වෙන්කර ගැනීමෙහි ලා සැලැස්මක් තිබූ බවය. නිවාස සංකීර්ණයන් ආගමික ගොඩනැගිලි, සුසාන භූමි මෙන්ම වැව් ගොඩ නැගීම සඳහාද නිශ්චිත ස්ථාන වෙන් කිරීමක් විය.

නගරයක් වශයෙන් අනුරාධපුරය සැලසුම් කිරීම ඉතාමත් ක්‍රමානුකූල විය. ඇතුළු නුවරත් පිට නුවරත් තුළ පිහිටිය යුතු උද්‍යාන, ආගමික ස්ථාන, සුසාන භූමි යනාදිය ස්ථානගත කිරීමේදී පැහැදලිවම නිශ්චිත ස්ථාන සැලසුමකට අනුව තෝරා ගැනීමත් සැලැස්මක් දැකීමටත් පුළුවන. මහා සීමාව වෙන් කිරීමේදී පර්වත වනාන්තර බහුලව ප්‍රයෝජනයට ගනිමින් යොදා ස්වාභාවිකව පිහිටි ස්ථානයන් ඒ අයුරින් පවත්වා ගනිමින් අනුරාධපුරය මහා සීමා මායිම් කර ඇත.අනුරාධපුරය නගරයක් බවට පත්වීමට පෙර අනුරාධගම වශයෙන් පැවතිණි. ගමට දකුණින් වැවක් විය. මෙය ගමක ප්‍රධාන ඒකකයක් විය. ගම කුඩාම පරිපාලන ඒකකය වූවා මෙන්ම ඉඩම් කළමනාකරණය කිරීමේ ප්‍රාථමික මට්ටමද විය. ගමක හෝ වත්තක කේන්ද්‍රස්ථානය වෙල්යායයි. ගමෙහි උස්බිම් උපාංග ලෙස සලකනු ලැබේ. නුවර කලාවිය ජනාවාස රටාවේ මෙම ගම් පදනම ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීමේ පදනමකට පසුබිම සකස් කර දුන් කරුණක් බවට පැහැදිලිය. වැවත් වෙලත්, දාගැබත් පසුබිම් කර පදනම් කොටගත් සිංහල ගම්මාන සැහෙන දුරට ස්වාධීන වූද ස්වයංපෝෂිත වූද ජනාවාස ඒකකයක් වශයෙන් පැවතුන බව අනුමාන කළ හැකි බව පෙනේ.

වියළි කලාපයේ භූමි පරිභෝගය කෘෂිකර්මාන්තය පදනම් කොට ගත්තක් වන අතර මිටියාවත් හා වැව් ජලය ලැබිය හැකි ප්‍රදේශ වී නිෂ්පාදනය සඳහා ද, ගෙවතු හා මිශ්‍ර වාවන් සඳහාද යොදාගෙන තිබුණි. වැව් කණ්ඩියෙන් අවසන් වන මාර්ගය කටු පඳුරු එළි කරන ලද විවෘත උස් භූමියක් දක්වා යොමු වී ඇත. ඉන් පසු යාර 50 - 100 පමණ දුරින් අවසන් වන ප්‍රදේශය කැළෑවක් සහ එය බවය වේ. එය ජීවත්වන පරිසරයේ සෞඛ්‍ය සනීපාරක්ෂාව මෙන්ම සතුන්ගේ නිවහන සඳහා හා ආහාර ලබා දීම සඳහා ආරක්ෂා කරනු ලැබීය.

5 ඒ. ෆොන්සේකා, **අතීත රජදරුවන්ගේ පරිසර ප්‍රතිපත්ති.** (කොළඹ: ග්ලෝබ් ප්‍රින්ටින් වර්ක්ස්.1998)

නගර නිර්මාණයේදී වෙළඳ මධ්‍යස්ථාන, වෛද්‍ය ශාලා, උද්‍යාන, පූජනීය ස්ථාන ආදී විවිධ ඉදිකිරීම් මනා සැලසුමකින් යුතුව සිදුකරන ලද බවට අනුරාධපුර පොළොන්නරු නගර සැලසුම් මඟින් මනාව පිළිඹිබු වේ. නගරයක් තුළ පාලක පක්ෂය සඳහා ගොඩනැගිලි විය. භික්ෂූන් වහන්සේලා සඳහා ඉදි වූ ගොඩනැගිලි අධ්‍යාපනය ලබා දුන් ස්ථාන, පූජා ස්ථාන, වෙළඳ ස්ථාන ආදී සේවාවන් විශාල සංඛ්‍යාවකි.

අභයගිරි වෙහෙර ඉදිකිරීමේදී රජතුමා එය නගරයෙන් උතුරු ප්‍රදේශයේ පිහිටුවා ඇති බව අභයගිරි කැණීම් වලදී රත්න ප්‍රසාදයෙන් හමු වී ඇති සෙල්ලිපි පාඨයක් අනුව සනාථ වී තිබේ. මෙහි කැණීම් අනුව සොයාගත් තොරතුරු වලට අනුව වඩාත් පැහැදිලිව දැකිය හැක්කේ ගොඩනැගිලි වලට භූමිය බෙදා වෙන් කරගැනීමේදී භික්ෂු වාසස්ථාන, රැස්වීම් ශාලා අභිෂේක මණ්ඩප, ආලේප නිෂ්පාදන ශාලා, වෙහෙර පොකුණු, ආසන සර දාන ශාලා වශයෙන් නියමිත සැලැස්මක් තිබුණු බවය. උද්‍යාන පිළිබඳ සංකල්පයද සැලසුම්කරණයේදි මනාව යොදා ගෙන ඇත. නගරයන් තුළ භූමි භාගයෙන් විශාල කොටසක් උද්‍යාන සඳහා වෙන් කර තිබුණි. අනුරාධපුරයේ නන්දන වනය නැතහොත් ජෝති වනය, හා මහාමේඝ වනයද උදාහරණ වේ. වියළි කලාපයේ දේශගුණය පිළිබඳව සලකා නගර තුළ උද්‍යාන නිර්මාණය සිදු වන්නට ඇති අතර භූමියේ ස්වාභාවික පිහිටීමද උද්‍යාන සඳහා ප්‍රයෝජනයට ගෙන ඇති අතර ඒ සඳහා නිර්මාණයට හා ආරක්ෂාවට විශේෂ කමිටු තිබූ බව කියවේ.

පූජනීය ස්ථානද සැලසුම්කරණයේදී සුවිශේෂී ස්ථානයක් හිමිකරගෙන ඇත. පැරණි නගර ගම් සියල්ලටම පාහේ පූජනීය ස්ථාන සඳහා වෙන් වූ භූමියක් වන අතර ඒ සඳහා තෝරාගෙන ඇති භූමියද සුවිශේෂී හා සමරූපී වේ. පූජනීය ස්ථාන සඳහා තැනිතලා භූමියෙහි තරමක් උසින් පිහිටි ස්ථාන තෝරා ගන්නා ලදී. මෙය මහින්දාගමනයට පසුව දීර්ඝ කාලයක් අඛණ්ඩව පැවති භූමි පරිභෝග ක්‍රමයකි. දෙවන පෑතිස් රජ උයනට ඇතුල් වූ තන්හි කුකුධ නම් වූ කුඩා වැවක් තිබූ බවත් වැව මතුයෙහි දිය කෙළවර උස් ස්ථානය සෑයක් පිහිටුවීමට යෝග්‍ය වූ උස් තැනක් සේ තෝරාගෙන ඇති බවද කියැවේ. පූජනීය ස්ථානයන්ට යොදා ඇති නම් අනුව මෙම ස්ථාන බොහොමයක්ම කඳු ගැට හා ගල් තලාවක පිහිටි බව සනාථ වේ. සඳගිරිගල වට ගුත්තර පර්වතයෙහි නැගෙනහිර පව් විහාරය සිතුල් පව්ව කොටගල ආදී මහා වංශයේ සඳහන් පූජනීය ස්ථාන නාම වලින්මෙන්ම පිහිටි ස්ථාන නිරීක්ෂණයෙන්ද සනාථ කළ හැක.[6]

බෞද්ධාගම ස්ථාපිත වීම හා භික්ෂු ශාසනයේ වර්ධනයත් සමඟ භික්ෂු ශාසනයේ වර්ධනයත් සමඟ භික්ෂූන් වහන්සේලාගේ හා ආරාම වල නඩත්තුව සඳහා භූමි කොටස් හෝ එම බිම් වල ආදායම් පවරා දෙනු ලැබ ඇත. සෙල්ලිපි වලින් භූමිය සංඝාරාම වලට පවරා දෙන ලද දීමනා වල මෙම අදහස ඉතා හොඳින් පැහැදිලි වේ. තවද සංඝාරාම වලට අයිති භූමිය මෙන්ම මිනිසුන්ද ආරක්ෂා කළ යුතු වූ බව තවදුරටත් සඳහන් කර ඇත.

මෙම උද්‍යාන, පූජනීය ස්ථාන ඉදි කිරීමේදී ශාක හා සත්ව සංරක්ෂණයට අවස්ථා ඇති කිරීමද සැලකිය යුතු කරුණකි. බෝ රුකට පූජා පැවැත්වීම ආදිය ඊට උදාහරණ වේ. පළමුවන උදය රජු (ක්‍රි. ව. 797 - 801) අනුරාධපුරය අසල චේතිය පර්වතයෙහි (මිහින්තලය) වූ සියලුම වෘක්ෂයන් නොයෙක් වර්ණයන්ගෙන් යුත් ධජ පතාකයන්ගෙන් සරසා පුද පූජා කරන ලද බවද සඳහන් වේ. තවද තේජස ආරක්ෂාව නිරූපනයට සත්ව රූප යොදාගන්නා ලදි. පූජනීය ස්ථාන වලට ඇතුල් වීමේදී පිහිටුවා ඇති දොරවල සත්ව රූප බොහෝ විට ඇතුළත් වේ.

දුටුගැමුණු රාජ්‍ය කාලයේ එම රජු විසින් කරන ලද මහා සෑයේ ඇත් පවුරක් තිබූ බව මහාවංශයේ සඳහන් වේ. සීගිරි රාජධානියේ මාලිගාවට ඇතුල් වීම සිංහමුඛයක් තුළින් සකස් කර ඇත. එමඟින් ශක්තිය, ආරක්ෂාව, ශද්ධත්වය, සෞභාග්‍ය පෙන්නුම් කරන බව සඳහන් වේ. එසේම සත්ත්ව ආරක්ෂාව පිළිබඳව ආකල්පයක් ජන සමාජය තුළ ඇති කිරීමට එය ඉවහල් වීමක් ලෙසද හඳුනා ගත හැකිය.බෞද්ධාගමික ස්ථානයන්හි චෛත්‍යය හෙවත් ස්ථූප නිර්මාණය සඳහාද භූමි ප්‍රමාණයක් නිසැකවම වෙන් වේ.

චෛත්‍යය ගොඩ නැගීම සඳහා භූමි භාගයක් තෝරා ගැනීම මහත් සැලකිල්ලෙන් කරල ලදි. අනූප, ජාංගල, සාධාරණ, ධූමක, පූර්ණ, චෛම, භද්‍රක, පද්ම, සටිම හා පූර්ව යන භූමි ප්‍රභේද 10 ක් ගැන

6 ඒ. ෆොන්සේකා, **අතීත රජදරුවන්ගේ පරිසර ප්‍රතිපත්ති.** (කොළඹ: ග්ලෝබ් ප්‍රින්ටින් වර්ක්ස්.1998)

මෙහි සඳහන් වන නමුදු ඉන් විස්තර කරන්නේ 4ක් පමණි. චෛත්‍ය ඉදි කිරීම සඳහා සෙසු භූමි වර්ග නුසුදුසු සේ සැලකුණු බව මෙයින් පෙනී යයි. කපු, පුවක් වැනි ගස් වර්ග වැවෙන, සිවු පාවුන් හා මී මැසි රංචු ගැවසෙන කශේරු හා මානෙල් වැවුණු දිය හෙබින් යුත් තෙත් වූ වැලි සහිත පොළොව අනූප නමින් හැඳින්වේ. තුරුලතා පෙළින් ආකි¾ණ වූ, සැහැල්ලු පසින් යුත් බොරළු සහිත තද පොළොව ජාංගල භූමීන්ගේ සංකලනයකි. කුඹුක්, පුවඟු, සඳුන්, බක් මී, කෝන්, උණ, කිහිරි, කොහොඹ, ඉඹුල් වැනි ගස් වර්ග වැවෙන වියැළී ගිය ජලය ඇති සතුන් හා වැදදන් ගැවසෙන භූමිය ධූමක නම්. මේ සියලු භූමි වර්ග චෛත්‍යයේ බර දරා සිටීමට සමත් දැඩි මතු පිටකින් යුක්ත වූ බව සිතා ගත හැකිය.[7] තවද මෙකී ලක්ෂණ සහිත භූමි චෛත්‍යය හා ආගමික සිද්ධස්ථාන සඳහා තෝරාගත් බවට ලක්දිව ඉතිහාසයෙන් ප්‍රකට උදාහරණ ගෙන හැර දැක්විය හැකි වේ. මිහින්තලය, සීගිරිය, රිටිගල, දිඹුලාගල ආදී ස්ථාන ඒ සඳහා උදාහරණ වේ. මේ අනුව ගත් කල බුදු දහමින් පෝෂණය වූ සංස්කෘතිය මඟින් පරිසරය හා මිනිසා අතර ඇති සම්බන්ධතාවය අතීත ගොඩනැගිලි හා සිද්ධස්ථාන තුළින් ප්‍රකට ලෙස විද්‍යාමාන වේ.

## සමෝධානය

අතීතයේදී ජන සමාජය පරිසරය සමඟ අන්‍යෝන්‍ය සම්බන්ධතාවයෙන් යුතුව සාමකාමී හා සහජීවනයෙන් ජීවත් වූ බව පෙන්වා දිය හැකි වේ. තවද ආගම සංස්කෘතිය මත ගොඩනැගුණු ආකල්ප තුළින් මිනිසා පරිසරය අතර නොබිඳෙන හා එකිනෙකා පරයා නොයන බැඳීමක් ගොඩනගාගෙන තිබූ බවත් හඳුනාගත හැකිය. පරිසරය පූජනීයත්වයෙන් සලකමින් පරිසර සම්පත් නිසි කළමනාකරණයෙන් යුතුව භාවිතා කොට ඇති බවත් හඳුනාගත හැකිය. මෙකී කරුණු අතීත ජන සමාජය තුළ ඉදි වූ ගඩොලකින් පවා විද්‍යාමාන වනු දැකිය හැකි වේ.

තවද පරිසරය හා සම්බන්ධ විවිධ සම්මුතීන් හා සංවිධාන මඟින් දීර්ඝ කාලීන පර්යේෂණ හා නිරීක්ෂණ මඟින් ඉදිරිපත් වන නව සොයාගැනීම්, සංකල්ප අතීතයේ ශ්‍රී ලංකා රජ සමය තුළ ක්‍රියාවට නැංවුණු ක්‍රියාවලීන් හා සමාන වන බවද දැකගත හැකිය. පරිසර සංරක්ෂණ ක්‍රියාමාර්ග තිරසාර සංකල්ප ආදිය නව සංකල්ප වුවද ඒවා බුදු දහමින් පෝෂණය වූ අතීත ලාංකික ජන සමාජය විසින් පිළිපදිනු ලැබූ ඒවා බව අතීත මූලාශ්‍ර පරිශීලනය කරන විට අවබෝධ කර ගත හැකි වේ.

ඒ අනුව අතීතයේ භූමි පරිභෝජනය සඳහා ගත් ක්‍රියාමාර්ගයන්හිදී පරිසරය සම්පතක් සේ සලකමින් පරිසරය තිරසාර ලෙස යොදා ගත් ආකාරය පිළිබඳව විමර්ෂණයක් මෙයින් ඉදිරිපත් කරන ලද අතර එවන් භාවිතයන් නැවත අධ්‍යාපනය හරහා සමාජගත කිරීම ඉතා සුදුසු කාලීන අවශ්‍යතාවයකි. මන්ද එවන් ශිෂ්ඨාචාරයක හිමි කරුවන් වන අපගේ අනාගත පරපුර මෙවන් පොහොසත් ආකල්ප වලින් සුපෝෂණය කරමින් නැවතත් එවැනි යුගයක් බිහි කිරීමට දායක වීමට හැකියාව ලැබෙනු ඇත.

7 ඩබ්. මාරසිංහ, මංජු ශ්‍රී භාෂිත වාස්තු විද්‍යා ශාස්ත්‍ර නාගරී පෙළ හා සිංහල පරිවර්තනය. :කොළඹ: සමයවර්ධන මුද්‍රණ ශිල්පියෝ, 2014)